මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
**Public Service Commission of Central Provincial Council**

අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கடுகஸ்தொட்டை வீதி, கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: www.psc.cp.gov.lk
e-mail: psc.cp.gov@gmail.com

| | | | | | |
|---|---|---|---|---|---|
| කාර්යාලය<br>காரியாலயம்<br>Office | 081-2213097 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 081-2213096 | සහකාර ලේකම්<br>உதவி செயலாளர்<br>Asst. Secretary | |
| ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 081-2213082 | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | සීපීසී/පීඑස්සී/9/6/2 හා 3 | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2022.03.02 |

මධ්‍යම පළාත් සභාවේ
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
ආයතන ප්‍රධානීන් වෙත

**මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013 (I) (2022)**

**හා**

**මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013 (II) (2022)**

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් 2022.02.25 දිනැති අංක 2269 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මගින් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ II සහ III වන ශ්‍රේණිවල නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා අයදුම්පත් කැඳවා ඇත.

02. ඒ අනුව, මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවා ව්‍යවස්ථාව අනුව, ඔබ ආයතනයේ සේවය කරනු ලබන ඉහත විභාගයන්ට පෙනී සිටීමට සුදුසුකම් ලැබූ මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ නිලධාරීන්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ (www.doenets.lk) වෙබ් අඩවියේ පළකර ඇති අයදුම්පත මාර්ගගත (online) ක්‍රමය ඔස්සේ ඉදිරිපත් කර, (මෙම අයදුම්පත් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය) එම අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ගැසට් නිවේදනයේ සඳහන් පරිදි 2022.03.28 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය.

03. "මධ්‍යම පළාත් සංකේත අංකය - 02" වන බැවින්, උක්ත සඳහන් විභාගයන් සඳහා අයදුම්පත් යොමු කිරීමේදී මධ්‍යම පළාත් කළමනාකරණ සේවයේ අයදුම්කරුවන් ලෙස වෙන්කර ගැනීම සඳහා සංකේත අංකය අයදුම්පතෙහි ශීර්ෂයෙහි අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය.

සැළකිය යුතුයි:-

- අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instruction) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේදී මෙම උපදෙස් තරයේ පිළිපදින්න.
- පළමුවරට මෙම විභාගයට අයදුම් කරන නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එසේකුදු වුවත් ඉන්පසු වාරවලදී එක් විෂයයකට රු. 200 බැගින් විභාග ගාස්තු ගෙවිය යුතුය. නිලධාරීන් විසින් විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන ගැසට් නිවේදනයේ ගාස්තු ගෙවීමේ ක්‍රමවේදය යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

04. ඉහත පරිදි අයදුම්පත් යොමු කරන ලද නිලධාරීන්ගේ නාම ලේඛනය ශ්‍රේණි අනුව වෙන් කොට මෙම කොමිෂන් සභා කාර්යාලය වෙත යොමු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

ටී.ඒ.ඩී.ඩබ්. දයානන්ද
ලේකම්,
මධ්‍යම පළාත් සභාවේ
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

පිටපත - 01. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් - දැ.ගැ.ස
02. විභාග කොමසාරිස් ජනරාල් - දැ.ගැ.ස හා අ.ක.ස